ජාත්‍යන්තර RTI දිනයට සමගාමීව RTI පනත සම්බන්ධව පාසල් දරුවන් දැනුවත් කිරීමේ අරමුණින් අධ්‍යාපන ආමාත්‍යාංශය මගින් පැවැත්වීමට නියමිත කෙටි චිත්‍රපට තරගය - 2024

## <u>තරඟ රීති සහ කොන්දේසි</u>

1. ඉදිරිපත් කරනු ලබන කෙටි චිත්‍රපට සඳහා,
   i. තරගයට ඉදිරිපත්වීම සඳහා - අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් අයදුම්පත්‍රය (Google Form) 2024.09.18 දිනට පෙර සම්පූර්ණ කළ යුතු වේ.
   ii. චිත්‍රපට ඉදිරිපත් කළ හැකි අවසාන දිනය - 2024.09.23
   iii. චිත්‍රපට නිර්මාණ කළ යුතු තේමාව - තොරතුරු දැනගැනීමේ පනතෙන් ලැබෙන ප්‍රතිලාභ
   iv. චිත්‍රපට ධාවන කාලය - මිනිත්තු 4 ට වැඩි, මිනිත්තු 10 ට නොවැඩි
   v. චිත්‍රපටයේ ගුණාත්මකභාවය - 720 pixel හෝ ඊට ඉහළ
   vi. රූපගත කරන මාධ්‍ය - කැමරා / ජංගම දුරකථන කැමරා
   vii. චිත්‍රපටයේ ආකෘතිය - සජීවී (Live) විය යුතුය. සජීවිකරණය කළ (Animated ) නොවිය යුතුය.
2. චිත්‍රපටයේ අධ්‍යක්ෂක(වරුන්) චිත්‍රපටය නිෂ්පාදනය කරන අවස්ථාවේ පාසල් ශිෂ්‍යයෙක් විය යුතුය.
3. සියලුම චිත්‍රපට ඉංග්‍රීසි භාෂාවෙන් උපසිරැසි කළ යුතුය.
4. ඉදිරිපත් කරනු ලබන නිර්මාණ අපහාසාත්මක හෝ, ජාතිවාදී හෝ, අසභ්‍ය ස්වභාවයෙන් යුක්ත නම් හෝ කිසියම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් ඉලක්ක කොට, පෞද්ගලික අභිමතාර්ථ සහිතව ඔවුන්ව අපහාසයට හෝ උපහාසයට හෝ ලක් කරන දර්ශන හෝ දෙබස් යම් චිත්‍රපටයක් තුළ අඩංගු නම් හෝ, එවැනි චිත්‍රපට ජූරි විමසුම සඳහා ඉදිරිපත් නොකරම තරගයෙන් බැහැර කරනු ලැබේ.
5. චිත්‍රපට කාණ්ඩය
   - Narrative - මිනිත්තු 4 සිට විනාඩි 10 දක්වා ධාවන කාලයක් ඇති ඕනෑම කතාන්දරයක් ඇති, ආඛ්‍යානයක් ඇති, නිර්මාණශීලි කෙටි චිත්‍රපටයක්
   - සුවිශේෂ - දැනුවත් කිරීමේ විඩියෝ, වෙළඳ දැන්වීම්, ගීත වීඩියෝ පට කිසිසේත් තරගය සඳහා පිළිගනු නොලැබේ.
6. චිත්‍රපට ඉදිරිපත් කළ හැකි ක්‍රමය - Digital Upload - ඔබේ චිත්‍රපටය, පසුව බාගත කර හැකි ආකාරයේ (Downloadable) ආරක්ෂිත (Secure) වෙබ් අඩවියකට උඩුගත (Upload) කල යුතුය. එම උඩුගත කිරීමෙන් අනතුරුව අප වෙබ් අඩවියේ ඇති අයදුම්පත පිරවීම මගින් ඔබේ චිත්‍රපටයට අදාළ සබැඳිය (Link) අපට යොමු කළ හැකිය. උදාහරණ - Google Drive
7. ඔබේ චිත්‍රපටය සමඟ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
   I. චිත්‍රපටයෙන් ගත් නිශ්චල ඡායාරූප කිහිපයක්
   II. චිත්‍රපටයේ ධාවන කාලය
   III. ඉංග්‍රීසි උපසිරැසි (චිත්‍රපටයට burn කර ඇති හෝ srt ගොනුවක් ලෙස ඇති)
   IV. චිත්‍රපටයේ කතාව සැකෙවින්(Synopsis)
   V. අධ්‍යක්ෂණය, කලා අධ්‍යක්ෂණය, සංගීත අධ්‍යක්ෂණය හා නිෂ්පාදනය පිළිබඳ තොරතුරු

(ඉදිරිපත්වන අයදුම්කරුවන් සඳහා අවස්ථා දෙකකදී කෙටි චිත්‍රපටිය සකස්කිරිම සම්බන්ධව මාර්ග ගත වැඩමුළු දෙකක් පැවැත්වීම කටයුතු සංවිධානය කර ඇත. එහි පළමු වැඩමුළුව මගින් චිත්‍රපටියේ කලාත්මකභාවය හා යොදාගන්නා තාක්ෂණය සම්බන්ධවත් දෙවන වැඩමුළුව මගින් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්බන්ධවත් අයදුම්කරුවන් දැනුවත් කිරීමට බලාපොරොත්තු වේ.)

## <u>ත්‍යාග සහ සහතික පත්‍ර</u>

පළමු වටය සහ දෙවන වටය සඳහා ඉදිරිපත් කරන කෙටි චිත්‍රපට සඳහා සහභාගීත්වය අගය කරමින් සහතික පත්‍ර ප්‍රදානය කරන අතර ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා හිමි ත්‍යාග හා සහතිකපත් 2024 .10.10 දින පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර තොරතුරු අයිතිවාසිකම පිළිබඳ සැමරුම් උත්සවයයේ දී පිරිනමනු ලැබේ.

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

වැඩිදුර විස්තර
අධ්‍යාපන අමාත්‍යාංශයේ RTI තොරතුරු දැනගැනීමේ මධ්‍යස්ථානය

දුරකථනය - 0112787399/ 0112787059 වෙබ් අඩවිය - moe.gov.lk විද්‍යුත් තැපැල - www.rti2016.edu@gmail.com